# ඇවිදින්න කකුලක්



දිනුගයා නිම්සාරා
විල්බාව

**කෘතියේ නම** ඇවිදින්න කකුලක්

**කතෘගේ නම** දිනුගයා නිම්සාරා විල්බාව

**කෘතිය පල කල දිනය**

2025-02-08

**978-624-208-438-1**

# පිදුම

මා වැනි සිසුවියකට
ඒ සතුටුදායික කතුවර
හැඟීම් ලැබීමට මට උදව් කරන්නා
වූ මාගේ ගුරුමෑණියන්ටත්,
ආදරණීය දෙමව්පියන්ටත්
ගෞරවයෙන් පුදමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ජෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනිමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිම්පාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"භෙරණගත්කරණි"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දිමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජිවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

මගේ නම පාවෙල්. මගේ එක කකුලක් කොටයි. මට ඉස්කෝලේ ළමයි කියන්නේ කකුල් කොටා කියලා. මම ආසයි ෆුට් බෝල් ගහන්න. අපේ ගෙදර ළග තියන පිට්ටනියේ ළමයි ෆුට් බෝල් ගහනවා.

මමටත් ආස හිතුනා.
මම ගෙදර ආවා. අම්මගෙන් ෆුට් බෝලයක් ඉල්ලුවා අම්මා මොකුත් කිව්වේ නෑ




THE
nike
boys

මට ෆුට් බෝල් ගහන්න ආස හිතුනා. එත් මගේ කකුලක් කොට හින්දා මොකුත් කරන්න බෑ. ගෙදර හිටියත් එලියට ගියේ නෑ. මට බයයි. ජනේලය ළගට වෙලා බලා ගෙන හිටියා.

මම ඒක දිහා බලන් ඉද්දි මට ආස හිතුනා. මම යන්න ගියා. ආච්චි මට යන්න එපා කිව්වා.මට ෆුට් බෝලයක් ඕන වුණා. මගේ උපන් දිනය ආවා.

මම තෑග්ගක් ඉල්ලුවා . ඒ ෆුට් බෝලයක් සහ කකුලක්. හැබැයි මට ලැබුනේ ෆුට් බෝලයක් විතරයි. මම ඒක තියාගත්තා කකුලක් ලැබුනම ගහන්න



මම කකුල වෙනුවට ඉනේ ඉදන් මගේ අනිත් කකුල වගේ යටට යනකන් ලිකැල්ලක් බැන්දා. එක පාරයි  කකුල තිබ්බේ ඒක කැඩුනා. මට ගොඩක් දුක හිතුනා.

මම එක කකුලෙන් ගෙදර ගියා. මම ළමයි සෙල්ලම් කරන විදිය බලාගෙන හිටියා.





ගෙදර ආවම අම්මා ඇහුවා අද කොහොමද ඉස්කෝලේ වැඩ කියලා. මම කිව්වේ වරදක් නෑ කියලා.

මම තාත්තත් එක්ක අපේ ගෙදර ළඟ තියෙන පිට්ටනියට ගියා. මට ආස හිතුනා.





ඒ වුනාට කවුරුත් මට කැමති නෑ. ඉස්කෝලේත් පටන් ගත්තා. මම ඉස්කෝලේ ගියා. මට ළමයි හිනාවෙන ගමන් කෑගැහුවා.

ඒ විතරක් නෙමෙයි ළමයි මට ගැහුවා. විවේක වෙලාව ආවා.

ළමයි පිට්ටනියට ගියා.





මගේ හොඳම යාළුවා තුලීන්
මාවත් පිට්ටනියට එක්ක ගියා.
ළමයි මාව එක්ක ආවා තරහට
එයාටත්යන්න  කිව්වා..

මම කිව්වා ඔයා ඉන්න මම
යන්නම් කියලා තුලීන් මට යන්න
එපා කිව්වා. ළමයි මට ගැහුවා.
මම බිම ඇදගෙන වැටුනා.
මගේ අත් කකුල් හීරුණා.



විවේකය අවසන් වුණා. මම
පන්තියට ගියා. ගුරුතුමිය මගේ
සීරුම් පාරවල් දැක්කා. මගෙන් ඒ
ගැන ඇහුවා.  මම කිව්වේ මම අඹ
ගහෙන් වැටුනා කියලා. ළමයි මට
හිනා උනා. ඉස්කෝලේ අවසන්
වුණා . මාව ගන්න තාත්තා ආවා.




4-A

නත්තල් කාලෙත් ආවා. මම හිතුවේ මම ඉල්ලපු කකුල ලැබෙයි කියලා.

හැබැයි හම්බ වුණේ නෑ. මම නත්තල දවස නිසා ගොඩක් සතුටින් හිටියා.

නත්තල් දවසත් ඉවර වුණා. මම අපේ වට පිටාවේ තිබුන ප්ලාස්ටික් කෑලි එකතු කරා. මට කකුල් හදන්න. හැබැයි මම කොහොමද තනියම කකුලක් හදන්නේ.

ඊළඟ දවසත් පටන් ගත්තා. මම ඉස්කෝලේ ගියා.අද ඉස්කෝලේ ළමයි මට මුකුත් කලේ නෑ. මම පන්තිය ළගට යනකොට ළමයි මගේ ඇස් දෙක වැහුවා.

වහලා පන්තියට ගෙනිච්චා ගුරු මේසය  උඩ ලොකු පෙට්ටයක් ගුරුතුම්ය මට ඒ පෙට්ටිය අරින්න කිව්වා.

ගුරුතුම්ය කිව්වා මේක ඔයාට කියලා. මට ගොඩක් සතුටුයි.



ඉස්කෝලේ අවසන් වුණා.
තාත්තා මාව ගන්න ආවා.
තාත්තාට පුදුමයි.

මම හරි හදිස්සියෙන්
ඇවිත් මගේ ෆුට්
බෝලය අරගත්තා.දැන්
මටත් පුළුවන් අනිත් ළමයි වගේ
සෙල්ලම් කරන්න. අපේ
ගෙදර ළඟ පිට්ටනියේ ළමයි දැන්
සෙල්ලම් කරනවා. මමත් ගියා. අද
මට සතුටුයි........





අපි හැමෝම මේ
වගේ අයට උදව්
කරන්න ඕන.
එයාලටත්
දිනන්න.





## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි  බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා  වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ  ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ  එකම ව්‍යාපෘතිය මෙයයි.
මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.
මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ  ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත්  සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන්  වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන්  ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්